| විභාග අංකය : |
|---|

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2021

ඔක්තෝබර් - 2023

## BMGT E 1035 - ව්‍යාපාර ආර්ථික විද්‍යාව

කාලය : පැය 03 යි

<u>උපදෙස්:</u>

- මෙම ප්‍රශ්න පත්‍රය A කොටස, B කොටස සහ C කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විතය.
- A කොටස අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සඳහා වඩාත්ම යෝග්‍ය පිළිතුර තෝරාගෙන එම පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම යටින් ඉරක් ඇඳ සලකුණු කරන්න. තවද ප්‍රශ්න පත්‍රයේ A කොටස විභාග ශාලාවෙන් පිටතට රැගෙනයාම සපුරා තහනම්ය.
- B කොටසෙහි හා C කොටසෙහි රචනා ශෛලියේ ප්‍රශ්න හයක් (06) ඇතුලත් වේ.
- B කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් (02) සහ C කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න එකක් (01) තෝරාගෙන කොටස් දෙකෙන්ම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- ජංගම දූරකථන, ස්මාර්ට් පරිගණක හෝ වෙනත් අංකිත උපාංගයන් භාවිතා කිරීම තහනම් වේ.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු ලැබේ.
- මුළු ලකුණු 100.

## A කොටස

1. සුක්ෂම ආර්ථික විද්‍යාව ..................................... කෙරෙහි අවධානය යොමු කරයි.
   - අ) ආර්ථික වර්ධනය, උද්ධමනය සහ විරැකියාව වැනි ගැටළු
   - ආ) සමස්ත ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය
   - ඇ) භාණ්ඩ හා සේවා වල සමාහාර ඉල්ලුමට බලපාන සාධක
   - ඈ) හිඟ සම්පත් කෙරෙහි පුද්ගලයන්ගේ සහ සංවිධානවල හැසිරීම

2. මල්ෂා අද සවස චිත්‍රපටියක් නැරඹීමට යාමට සුදානමින් සිටී. චිත්‍රපටිය නැරඹීමේදී ටිකට් එකක මිල රුපියල් 300ක් වන අතර මේ හේතුවෙන් ඇයට රුපියල් 500 ක් ගෙවන උපකාරක පන්තිය අවලංගු කිරීමට සිදුවේ. චිත්‍රපටිය නැරඹීමේ ආවස්ථික පිරිවැය වන්නේ:
   - අ) රුපියල් 300
   - ආ) රුපියල් 500
   - ඇ) රුපියල් 800
   - ඈ) රු.800 අඩු කිරීම චිත්‍රපටිය නැරඹීමේ ප්‍රතිලාභය

3. Qd යනු ඉල්ලුම් ප්‍රමාණයත්, Qs යනු සැපයුම් ප්‍රමාණයත්, P යනු මිලත් වේ. $Qd = 20 - 2P$ සහ $Qs = 5 + 3P$ නම්, සමතුලිත ප්‍රමාණය වන්නේ,
   - අ) ඒකක 20
   - ආ) ඒකක 5
   - ඇ) ඒකක 14
   - ඈ) ඒකක 3

4. A භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම වෙනස් වීමට හේතු නොවන්නේ පහත සඳහන් කවරක් ද?
   - අ) B නම් සමීප ආදේශක භාණ්ඩයේ මිලෙහි වෙනසක් වීම.
   - ආ) පාරිභෝගික ආදායම වැඩි වීම.
   - ඇ) A හි මිලෙහි වෙනසක් වීම.
   - ඈ) පාරිභෝගික රුචිකත්වයේ වෙනසක් වීම.

5. හසිනිගේ ආදායම සතියකට රුපියල් 950 සිට රුපියල් 1050 දක්වා වැඩි වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඇය මසකට නැරඹීමට යන චිත්‍රපට සංඛ්‍යාව 5% කින් වැඩි කිරීමට තීරණය කරයි. චිත්‍රපට සඳහා ඇයගේ ආදායම් ඉල්ලුම නම්‍යතාවය,

අ) අනම්‍ය වේ.

ආ) නම්‍ය වේ.

ඇ) සිරස් රේඛාවකින් නිරූපණය කෙරේ.

ඈ) තිරස් රේඛාවක් මගින් නිරූපණය කෙරේ.

6. ආදායමේ 10% ක වැඩිවීමක් දොඩම් යුෂ ඉල්ලුම් ප්‍රමාණය ලීටර් 19,200 සිට 20,800 දක්වා වැඩි වීමට හේතු වේ. දොඩම් යුෂ සඳහා අදායම් ඉල්ලුම් නම්‍යතාවය,

අ) 0.8　　　ආ) 1.2

ඇ) 1.0　　　ඈ) 0.5

7. උපේක්ෂා වක්‍රයකින් (Indifference curve) දැක්වෙනුයේ,

අ) භාණ්ඩ දෙකක සමාන පරිභෝජනයයි.

ආ) භාණ්ඩ සංයෝජන දෙකක් පරිභෝජනය කිරීමෙන් ලැබෙන සමාන උපයෝගීතාවයි.

ඇ) සමාන පාරිභෝගික ආදායමක්.

ඈ) පරිභෝජනය කරන භාණ්ඩවල සමාන මිල ගණන්.

8. ආන්තික උපයෝගීතාව නිර්වචනය කරන්නේ පහත සඳහන් ඒවායින් කවරක්ද?

අ) මුළු උපයෝගිතවයේ වෙනස භාණ්ඩයේ මිලෙන් බෙදීම.

ආ) භාණ්ඩයක් පරිභෝජනය කිරීමෙන් ලැබෙන උපරිම තෘප්තිය.

ඇ) පරිභෝජනය සඳහා ඇති භාණ්ඩයන් හැකි තරම් පරිභෝජනය කිරීමෙන් ලැබෙන මුළු තෘප්තිය.

ඈ) කිසියම් භාණ්ඩයක අතිරේක ඒකකයක් පරිභෝජනය කිරීමෙන් ලැබෙන අමතර තෘප්තිය.

9. ආයතනයක් ඒකක 1000 ක් නිෂ්පාදනය කරන අතර එහි මුළු පිරිවැය රුපියල් 5000 කි. ඒකක 1001 දක්වා නිෂ්පාදනය වැඩි වැඩි කිරීමේදී, එහි මුළු පිරිවැය රුපියල් 5008 දක්වා ඉහළ යනු.ඇත. මෙම තොරතුරු මගින්ආයතනය ගැන ඔබට පවසන්නේ කුමක්ද?

අ) ආන්තික පිරිවැය රු. 5 ක් වන අතර සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 8 කි.

ආ) ආන්තික පිරිවැය රු. 8 ක් වන අතර සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 5 කි.

ඇ) ආන්තික පිරිවැය රුපියල් 5 ක් වන අතර සාමාන්‍ය මුළු පිරිවැය රුපියල් 8 කි.

ඈ) ආන්තික පිරිවැය රු. 8 ක් වන අතර සාමාන්‍ය මුළු පිරිවැය රු. 5 කි.

10. පූර්ණ තරඟකාරී වෙළඳපොලක එක් ආයතනයක් එහි නිමැවුම් මට්ටම වැඩි කරන්නේනම්, වෙළඳපල සැපයුම

අ) වැඩි වන අතර වෙළඳපල මිල පහත වැටෙනු ඇත.

ආ) වැඩි වනු ඇති අතර වෙළඳපල මිල ඉහළ යනු ඇත.

ඇ) සහ වෙළඳපල මිල දෙකම ස්ථාවරව පවතිනු ඇත.

ඈ) අඩු වන අතර වෙළඳපල මිල ඉහළ යනු ඇත.

11. පූර්ණ තරඟකාරී ආයතනයක් නිෂ්පාදනය අඩු කළ යුතු හෝ කෙටි කාලීනව වසා දැමිය යුතු වන්නේ, මිල

අ) සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි වනවිට.

ආ) සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු වනවිට.

ඇ) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි වනවිට.

ඈ) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා අඩු වනවිට.

12. පූර්ණ තරඟකාරීත්වය සහ ඒකාධිකාරී තරඟය අතර වෙනස දැක්වෙන්නේ පහත කුමක් ඇසුරින්ද?

අ) ඒකාධිකාරී තරඟකාරී ආයතන තම නිෂ්පාදනයේ මිල මෙන්ම එහි ගුණාත්මකභාවය සහ අලෙවිකරණය මත තරඟ කරයි.

ආ) ඒකාධිකාරී තරඟයකදී, වෙළඳපලට ඇතුල්වීම අවහිර කරනු නොලැබේ.

ඇ) පූර්ණ තරඟකාරී වෙළඳපල තුළ ස්වාධීනව ක්‍රියා කරන විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් ඇත.

ඈ) කෙටි කාලීනව ආර්ථික ලාභයක් උපයා ගත හැක්කේ ඒකාධිකාරී තරඟකාරී ආයතන වලට පමණි.

13. ඒකාධිකාරී ආයතනයක පිරිවැය ශ්‍රිතය TC = 10 + 2Q වේ. මෙම වෙළඳපොලේ ඉල්ලුම Q = 14 - P සමීකරණය මගින් ලබා දී ඇත. මෙම ඒකාධිකාරයට එක මිලක් පමණක් අය කළ හැකි නම්, කෙටි කාලීනව එහි ලාභය වනුයේ:

අ) -8

ආ) 10

ඇ) 26

ඈ) 34

14. යම් ආර්ථිකයක අපනයන රු. බිලියන 40 ක සහ ආනයනය රු. බිලියන 175 ක් වේ.පාරිභෝගික වියදම් රු. බිලියන 2343 දක්වා වැඩිවී ඇති අතර, දළ ආයෝජනය රු. බිලියන 379 ක් සහ රජයේ වියදම් රු. බිලියන 865 කි. එම ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය වනුයේ,

අ) රු. බිලියන 3722 කි.

ආ) රු. බිලියන 3452 කි.

ඇ) රු. බිලියන 3802 කි.

ඈ) ප්‍රමාණවත් සංඛ්‍යා නොමැති නිසා දළ දේශීය නිෂ්පාදිතය ගණනය කළ නොහැකිය.

15. වෙළඳපල මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සමාන වන්නේ පහත දැ අතරින් කුමකටද?

අ) වෙළඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය + ශු.විදේශ සාධක ආදායම්

ආ) වෙළඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය - ශු.විදේශ සාධක ආදායම්

ඇ) වෙළඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය - අපනයනය

ඈ) වෙළඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය + ආනයන

16. IS-LM ආකෘතියේ, නිමවුමේ අඩුවීමක් .....................හි ප්‍රතිඵලයක් වනු ඇත.

අ) බදු අඩු කිරීම

ආ) මුදල් සැපයුම වැඩි වීම

ඇ) මුදල් ඉල්ලුම වැඩි වීම

ඈ) රජයේ මිලදී ගැනීම් වැඩි වීම

17. රජයේ වියදම් අඩුවීම නිසා,

අ) LM වක්‍රය ඉහළට විතැන් වේ.

ආ) IS වක්‍රය වමට විතැන් වේ.

ඇ) LM වක්‍රය පහලට විතැන් වේ.

ඈ) IS වක්‍රය දකුණට විතැන් වේ.

18. රැකියා සොයන්නන්ට සුදුසු රැකියා අවස්ථා සොයා ගැනීම සඳහා සහ සේව්‍යන්ට අවශ්‍ය සුදුසු සේවකයන් තෝරා ගැනීමට ගතවන කාලය තුල ඇතිවන රැකියා වියුක්තිය හඳුන්වනු ලබන්නේ

අ) ඍතුමය විරැකියාව ( Seasonal Unemployment)

ආ) චක්‍රීය විරැකියාව ( Cyclical Unemployment)

ඇ) ඝර්ෂණ විරැකියාව ( Frictional Unemployment)

ඈ) ව්‍යුහමය විරැකියාව ( Structural Unemployment)

19. ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනයට (Demand-pull inflation) හේතු විය හැක්කේ,

අ) පිරිවැය වැඩිවීමයි.

ආ) පොලී අනුපාත අඩු වීමයි.

ඇ) රජයේ වියදම් අඩු කිරීමයි.

ඈ) සමාහාර සැපයුම අඩුවීමයි.

20. පිලිප්ස් වක්‍රය අනුව, විරැකියාව පහත වැටෙන විට:

අ) උද්ධමනය අඩු වේ.

ආ) උද්ධමනය නොවෙනස්ව පවතී.

ඇ) උද්ධමනය වැඩි වේ.

ඈ) නිමැවුම පහත වැටේ.

(01 x 20 = මුළු ලකුණු 20)

## B කොටස

**ප්‍රශ්න අංක 01**

අ) *"සූක්ෂම ආර්ථික මූලධර්ම එකවර ක්‍රියාත්මක නොකර කෙනෙකුට සැබවින්ම සාර්ව ආර්ථික මූලධර්ම ක්‍රියාත්මක කළ නොහැක."*

ඉහත ප්‍රකාශය ආශ්‍රිතව, ව්‍යාපාර ආර්ථික විද්‍යා න්‍යායන් ආයතනවල මෙහෙයුම් ගැටලු විසඳීමට සහ කළමනාකරණ තීරණ ගැනීමේදී යෙදිය හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ආ) පුවත්පත් සඳහා වෙළඳපොලේ සමතුලිත මිල සහ ප්‍රමාණය කෙරෙහි පහත සඳහන් එක් එක් සිද්ධියෙහි බලපෑම සුදුසු ප්‍රස්ථාර භාවිතා කරමින් පැහැදිලි කරන්න.

i. පුවත්පත් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍යවල මිල වැඩි වීම.

ii. මිනිසුන් අන්තර්ජාලයෙන් සහ ඩිජිටල් මූලාශ්‍රවලින් ප්‍රවෘත්ති ලබා ගැනීම.

(ලකුණු 06)

ඇ) භාණ්ඩයක ඉල්ලුම සහ සැපයුම් ශ්‍රිතයන් පහත පරිදි දක්වා ඇත.

$Qd= 900 - 4P$

$Qs= 500 + 4P$

i. සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 02)

ii. රජය උපරිම මිල ඒකකයකට රුපියල් 20 ක් නියම කලවිට ඇතිවන කළුකඩ මිල සොයන්න.

(ලකුණු 02)

ඇ) ඇමේසන් ආයතනයේ පෙන් ඩ්‍රයිව් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය -0.4 වේ. ඇමේසන් ආයතනයට පෙන් ඩ්‍රයිව් 10%ක් වැඩියෙන් අලෙවි කිරීමට අවශ්‍ය නම්, පෙන් ඩ්‍රයිව් වල මිල සම්බන්ධයෙන්ඇමේසන් ආයතනය කුමක් කළ යුතුද?

(ලකුණු 03)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 02

ආ) උපේක්ෂා වක්‍ර විශ්ලේෂණයට අනුව පාරිභෝගිකයා සමතුලිතතාවයට ළඟා වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) පහත තොරතුරු භාවිතා කරමින් උපයෝගිතාව උපරිම කිරීමේ භාණ්ඩ සංයෝජනය සොයන්න.

A භාණ්ඩයේ මිල = රු: 1

B භාණ්ඩයේ මිල = R: 2

| ඒකක | ආන්තික උපයෝගීතාවය (A) Mu(A) | ආන්තික උපයෝගීතාවය (B) Mu(B) |
|---|---|---|
| 1 | 13 | 24 |
| 2 | 08 | 20 |
| 3 | 04 | 18 |
| 4 | 02 | 16 |
| 5 | 01 | 12 |

(ලකුණු 05)

ඇ) උපේක්ෂා වක්‍ර සහ අයවැය රේඛා භාවිතයෙන් භාණ්ඩයක් සඳහා ඉල්ලුම් වක්‍රයක් ව්‍යුත්පන්න වන ආකාරය රූප සටහන් භාවිතා කර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) "නිෂ්පාදන ශ්‍රිතය මඟින් යෙදවුම් සහ නිමැවුම් අතර සම්බන්ධතාවය විස්තර කරයි. කෙටිකාලයේදී යෙදවුම් වලින් අඩුම තරමින් එක යෙදවුමක්වත් ස්ථාවරව තිබෙන අතර ආයතනයට නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය නම් එය කළ හැක්කේ නිෂ්පාදන විචල්‍ය සාධක ප්‍රමාණය වැඩි කිරීමෙන් පමණි. ශ්‍රම බලකායේ ප්‍රමාණය වැඩිවීමේදී සමස්ත නිමවුමේ ඇතිවන බලපෑම පැහැදිලි කිරීමට සහ නිෂ්පාදනය සඳහා හොඳම කලාපය ඉස්මතු කිරීමට රූප සටහන් භාවිතා කරන්න.

(ලකුණු 10)

ආ) දිගුකාලයේදී යම් නිමැවුම් මට්ටමක් දක්වා ආර්ථික පිරිමසුම් (Economies of Scale) සහ ඉන් ඔබ්බට ආර්ථික නොපිරිමසුම් (Diseconomies of Scale) ආයතනයක් විසින් අත්විඳිය හැක්කේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) ආයතනයක් පහත පරිදි ඉල්ලුම් සහ මුළු පිරිවැය ශ්‍රිතයන් වලට මුහුණ දෙයි,

$$P = 400 - 3Q$$

$$TC = 50 + 2Q^2$$

i. ලාභය උපරිම කරන නිමැවුම් මට්ටම සහ ආයතනයේ මිල ගණනය කරන්න.

(ලකුණු 03)

ii. ලාභය උපරිම කරන අවස්ථාවේදී දී මෙම ආයතනයේ ලාභය සොයන්න.

(ලකුණු 02)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

ඇ) ප්‍රස්ථාර භාවිතා කර පූර්ණ තරඟකාරී වෙළඳපල ව්‍යුහයක් තුල ක්‍රියාත්මක වන ආයතනක කෙටි කාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කර දක්වන්න.

(ලකුණු 05)

ආ) ඒකාධිකාරී තරඟකාරී වෙළඳපල ව්‍යුහය තුළ භාණ්ඩ විවිධාංගීකරණය ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. මෙයට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 05)

ඇ) " ප්‍රායෝගිකව ඒකාධිකාරී ආයතනවල මෙහෙයුම් කටයුතු සියලුම ධනවාදී රටවල විවේචනයට ලක්ව ඇති අතර මහජන මතය වන්නේ මෙම ආයතනවල ක්‍රියාකාරකම් පාලනය කලයුතු බවයි." ඒකාධිකාරී ආයතනයක ක්‍රියාකාරිත්වය මහජන සුබසාධනය අඩු කරයිද? ප්‍රස්තාර භාවිතයෙන් පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

## C කොටස

**ප්‍රශ්න අංක 05**

අ) පහත වගුවේ ABC ආර්ථිකයක ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන කිහිපයක් පෙන්වයි.

| අයිතමය | | රුපියල් මිලියන |
|---|---|---|
| පරිභෝජන වියදම් | | 250 |
| දළ ආයෝජන | | 60 |
| ක්ෂය | | 40 |
| රාජ්‍ය වියදම් | | 94 |
| ආනයන | 22 | |
| අපනයන | 20 | |
| සංක්‍රාම වියදම් | | 40 |
| බදු | | 120 |

i. වර්ෂය සඳහා ABC ආර්ථිකයෙහි හි දළ දේශීය නිෂ්පාදිතය (GDP) සොයන්න.
ii. ඉහත වගුවේ දත්ත භාවිතා කරමින් ශුද්ධ ආයෝජනය ගණනය කරන්න.
iii. වගුවේ ඇති දත්ත භාවිතා කරමින් ආර්ථිකයේ මුළු සම්පත් ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 06)

ආ) *"උද්ධමනය යනු සාමාන්‍යයෙන් ආර්ථිකය සඳහා විශාලතම ගැටලු ඇති කරන ප්‍රධාන සාර්ව ආර්ථික සංසිද්ධියයි."*

ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) පහත සඳහන් විරැකියා තත්වයන් පැහැදිලි කරන්න.

i. චක්‍රීය විරැකියාව
ii. ව්‍යුහාත්මක විරැකියාව

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 06

අ) "භාණ්ඩ සහ සේවා වෙළඳපොළ සහ මුදල් වෙළඳපොළ අතර අන්තර් රඳා පැවැත්මක් පවතී." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) පහත සිදුවීම් සමතුලිත පොලී අනුපාතයට සහ ජාතික ආදායමට බලපාන ආකාරය පැහැදිලි කරන්න,

i. රජය මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීම.

ii. රජයේ වියදම් වැඩි කිරීම.

(ලකුණු 06)

ඇ) කිසියම් ආර්ථිකයක පහත තොරතුරු ඔබට සපයා ඇත. (වටිනාකම රුපියල් මිලියන වලින්)

| | |
|---|---|
| $C = 40 + 0.8yd$ | (පරිභෝජනය) |
| $T = 0.25y$ | (බදු) |
| $Tr = 10$ | (සංක්‍රාම) |
| $I = 400 - 20r$ | (ආයෝජන) |
| $G = 450$ | (රාජ්‍ය ආදායම) |
| $Ms = 3500$ | (මුදල් සැපයුම) |
| $P = 10$ | (මිල මට්ටම) |
| $Mt = 0.25y$ | (ගනුදෙනු චේතනාව සඳහා ඉල්ලුම) |
| $Msp = -30r$ | (සමපෙක්ෂන චේතනාව සඳහා ඉල්ලුම) |

සමතුලිත ජාතික ආදායම සහ පොලී අනුපාතය ගණනය කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**